රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
அரசாங்க தகவல் திணைக்களம்
Department of Government Information

# 2024-02-05 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹුණු තීරණ

## 01. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම - 2023-2030

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ විධිවිධාන පරිදි ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රමුඛ වගකීමක් වේ. ඒ අනුව, 2023-2030 සෙන්දායි ක්‍රියාකාරී රාමුව, තිරසර සංවර්ධන ඉලක්ක හා දේශගුණික විපර්යාස පිළිබඳ සම්මුතීන්ට අනුකූලව සහ අදාළ සියලුම විෂයානුබද්ධ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් යුතුව 2023-2030 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම සකස් කරනු ලැබ ඇත. ඒ අනුව, ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම - 2023-2030 පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී.

## 02. පුනර්ජනනීය බලශක්තිය භාවිතයෙන් ශ්‍රී ලංකාවේ රෝහල්වල බලශක්ති සැපයුම ස්ථායීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වන ජපාන රජයේ ව්‍යාපෘති ආධාරය

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල, කුරුණෑගල ශික්ෂණ රෝහල සහ රත්නපුර ශික්ෂණ රෝහල යන රෝහල්වල සූර්ය බලශක්ති උත්පාදන පද්ධති ස්ථාපිත කිරීම මඟින් විදුලි පහසුකම් සපයාගැනීම සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය හරහා ජපන් යෙන් මිලියන 1,230ක ව්‍යාපෘති ආධාරයක් (රුපියල් බිලියන 2.8ක් පමණ) ලබා දීමට ජපාන රජය විසින් එකඟතාව පළ කර ඇත. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ පුනර්ජනනීය නොවන බලශක්ති භාවිතය අවම කිරීම, සෞඛ්‍ය සේවා අංශයේ සමස්ත කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණු වේ. ඒ අනුව, එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலப்பன அவென்யூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු தொ T - (+94 11) 2515759
ෆැ பெ F - (+94 11) 2514753
ඊ மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

03. **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ සංයුක්ත හා තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ උපායමාර්ගය**

හරිත ව්‍යාපාර සහ අවදානමට ලක් විය හැකි ප්‍රජාවන් සවිබල ගන්වන සමාජ ව්‍යවසායයන් ඇතුළුව ධනාත්මක සමාජීය හා පාරිසරික බලපෑම් ඇති කරන වාණිජමය වශයෙන් ශක්‍යතාවයෙන් යුත් ආකෘති සහිත අරමුණු මත පදනම් වූ ව්‍යවසායයන් සංයුක්ත හා තිරසර ව්‍යාපාර (Inclusive and Sustainable Businesses - ISBs) වශයෙන් හඳුන්වනු ලබයි. ශ්‍රී ලංකාව තුළ දැනට පවතින සංයුක්ත හා තිරසර ව්‍යාපාර (ISBs) සඳහා ප්‍රමාණවත් තොරතුරු, නිපුණතා පුහුණුව, හවුල්කාරිත්වය, මූල්‍ය පහසුකම් සහ විධිමත් පිළිගැනීම යනාදිය සඳහා ප්‍රවේශයක් නොමැති වීම හේතුවෙන් එකී ව්‍යාපාරයන්හි වර්ධනය සහ එමඟින් කෙරෙන ධනාත්මක බලපෑම සීමා වීමට හේතු වී ඇත. එබැවින්, සංයුක්ත හා තිරසර ව්‍යාපාර (ISBs) සංවර්ධනයට සහායවීමේදී සහ පහසුකම් සැලසීමේදී ජාතික ව්‍යාපාර, කර්මාන්ත, මූල්‍ය හා ආයෝජනයන්ට අදාළ වන රජයේ ප්‍රතිපත්තිවලට සංයුක්ත හා තිරසර ව්‍යාපාර (ISBs) ප්‍රවර්ධනය කිරීමට අදාළ වන විධිවිධාන ඒකාබද්ධ කිරීම පිණිස විශේෂිත උපායමාර්ගවල අවශ්‍යතාව පැන නැගී ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා තිරසර සංවර්ධන සභාව විසින් ආසියා පැසිෆික් කලාපය සඳහා වන එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසමේ (UNESCAP) වෙළෙඳ, ආයෝජන සහ නවෝත්පාදන අංශයේ සහාය ඇතිව අදාළ සියලු පාර්ශ්වයන්ගේ අදහස් ලබාගෙන "තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව තුළ සංයුක්ත හා තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ උපායමාර්ගය" සකස් කරනු ලැබ තිබේ. එකී උපායමාර්ගය ක්‍රියාත්මක කිරීම පිණිස මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

04. **ඇමෙරිකා එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආධාර යටතේ ශ්‍රී ලංකාවේ වෙළෙඳපොළ සන්ධාන හරහා ස්වයං පාලනය, සාක්ෂරතාව සහ අවධානය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - අදියර II**

වෙළෙඳපොළ සන්ධාන හරහා ස්වයං පාලනය, සාක්ෂරතාව සහ අවධානය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඇමෙරිකානු එක්සත් ජනපදයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා Save the Children ආයතනය හරහා ඇමෙරිකානු ඩොලර් මිලියන 26ක ප්‍රදානයක් 2018 වර්ෂයේදී ඇමෙරිකානු එක්සත් ජනපද රජය විසින් ශ්‍රී ලංකාවට ලබා දී ඇත. එකී ව්‍යාපෘතිය 2024 වර්ෂයේ දෙවන කාර්තුව වන විට අවසන් වීමට නියමිත අතර, එම ව්‍යාපෘතියෙහි දෙවන අදියර ක්‍රියාත්මක

කිරීම සඳහා Save the Children ආයතනය හරහා ඇමෙරිකානු ඩොලර් මිලියන 32.5ක ප්‍රදානයක් ලබා දීමට ඇමෙරිකානු රජය විසින් පියවර ගනු ලැබ ඇත. රජය මඟින් ක්‍රියාත්මක කරන "පාසල් ආහාර වැඩසටහන" තුළ කෙටිකාලීන සම්පත් හිඩැස් පූරණය කිරීම, පාසල් වයසේ දරුවන්ගේ සාක්ෂරතාව වැඩිදියුණු කිරීම, පාසල් හා ප්‍රජාවන් සඳහා යහපත් සෞඛ්‍යය, සනීපාරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සහ සහායක පද්ධතීන් ශක්තිමත් කිරීම හා තිරසරභාවය උදෙසා ධාරිතා සංවර්ධනය අරමුණු කර ගනිමින් ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. ඒ අනුව, අදාළ පාර්ශ්වයන් අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**05. 1974 මුහුදේදී ජීවිතාරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 1988 ප්‍රොටොකෝලය හා 2003දී සංශෝධිත 1966 බඩු බර රේඛා පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 1988 ප්‍රොටොකෝලය සඳහා ප්‍රවේශවීම**

ශ්‍රී ලංකා රජය විසින් පසුගිය වසර 40ක් පුරා සමුද්‍රීය සම්මුති සහ ප්‍රොටොකෝල 19ක් අපරානුමත කරමින් සමුද්‍රීය ජාතියක් ලෙස ශ්‍රී ලංකාවේ වර්ධනය සඳහා මහඟු දායකත්වයක් ලබාගෙන ඇත. සාමාජික රාජ්‍යයන් ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානයේ සම්මුතිවලට අනුගතව කටයුතු කිරීම අත්‍යවශ්‍ය වන අතර එකී අවශ්‍යතාව සපුරාලීමට සහ 1974 මුහුදේදී ජීවිතාරක්ෂාව පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 1988 ප්‍රොටොකෝලය සහ 2003දී සංශෝධිත 1966 බඩු බර රේඛා පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ 1988 ප්‍රොටොකෝලය සඳහා වන විධිවිධාන ඇතුළත් කිරීමට හැකි වන පරිදි 1971 අංක 52 දරන වෙළෙඳ නාවික පනත සංශෝධනය කිරීමට පියවර ගනු ලැබ ඇත. ඒ අනුව, එකී ප්‍රොටොකෝලයන්ට අදාළ තැන්පතු සමඟ ඇතුළත් කිරීමේ ලේඛන විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා තැන්පත් කරමින් එකී ප්‍රොටොකෝලයන්ට ප්‍රවේශ වීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **මාර්තු මාසයේ 21 වන දිනය ජාතික නාවිකයින්ගේ දිනය වශයෙන් ප්‍රකාශයට පත් කිරීම**

ශ්‍රී ලංකාවේ දේශිය ආර්ථිකයට නාවිකයින් විසින් ලබා දෙන දායකත්වය ඇගයීම පිණිස, ජාතික නාවිකයින්ගේ දිනයක් ප්‍රකාශයට පත් කිරීම යෝග්‍ය බවට හඳුනාගනු ලැබ තිබේ. එමඟින් නාවික වෘත්තිය සඳහා උනන්දුවක් දක්වන්නන් ආකර්ෂණය කර ගැනීම හරහා විදේශ විනිමය ඉපයීමේ අවස්ථා ඇති කිරීම සහ සමුද්‍රීය අංශයේ සේවාවන් වැඩිදියුණු කිරීම මඟින් ජාතික ආර්ථිකයට ලබා දෙන දායකත්වය ඉහළ නැංවීමට හැකියාව ලැබෙනු ඇත. ඒ අනුව, සෑම වර්ෂයකම මාර්තු මාසයේ 21 වන දිනය 'ජාතික නාවිකයින්ගේ දිනය' වශයෙන් ප්‍රකාශයට පත් කිරීම පිණිස වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. **පූර්ණ ශ්‍රවණාබාධිත පුද්ගලයින් සඳහා සැහැල්ලු වාහන රියදුරු බලපත්‍ර ලබා දීම**

පූර්ණ ශ්‍රවණාබාධිත පුද්ගලයින් සඳහා සැහැල්ලු වාහන රියදුරු බලපත්‍ර ලබා දීම පිණිස නියමු ව්‍යාපෘතියක් ගම්පහ දිස්ත්‍රික්කය කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කිරීම පිණිස 2022-11-14 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, එකී නියමු ව්‍යාපෘතියෙහි ප්‍රතිඵල සහ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළව ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පත් කරනු ලැබ ඇති කමිටුවේ නිර්දේශ මත පදනම්ව මුළු දිවයිනම ආවරණය වන පරිදි පූර්ණ ශ්‍රවණාබාධිත පුද්ගලයන්හට සැහැල්ලු වාහන රියදුරු බලපත්‍ර ද්විවාර්ෂිකව අලුත් කිරීමේ පදනම මත නිකුත් කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීම සඳහා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. **ලෙලි කජු ආනයනය කිරීම**

මෙරට වාර්ෂික ලෙලි කජු අවශ්‍යතාව මෙට්‍රික්ටොන් 25,000ක් පමණ වන නමුත් දැනට දේශිය වශයෙන් සපයා ගත හැක්කේ මෙට්‍රික්ටොන් 12,500ක් පමණි. පසුගිය කන්නය තුළ අපේක්ෂිත අස්වැන්න නොලැබීම හේතුවෙන් මෙරට කජු කර්මාන්තයේ පැවැත්මට බෙහෙවින් අවාසිදායක තත්ත්වයක් ඇති වී තිබේ. මෙම තත්ත්වය සැලකිල්ලට ගෙන මෙම වර්ෂය සඳහා උපරිම වශයෙන් ලෙලි කජු මෙට්‍රික්ටොන් 15,000ක්

ආනයනය කිරීමටත්, ඉන් අනතුරුව, අදාළ අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් නිර්ණය කරනු ලබන ලෙලි කපු ප්‍රමාණයක් ඉදිරි වසර 04ක කාලය තුළ දේශීය කපු අස්වැන්න නොලැබෙන දෙසැම්බර් සිට අප්‍රේල් මාසය දක්වා වන කාලසීමාවේදී ආනයනය කිරීමටත් කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**09. 2024 අයවැය යෝජනා අනුව නාගරික නිවාස හිමිකම යටතේ අඩු ආදායම්ලාභී පවුල් 50,000කට ඔවුන් පදිංචි නිවාස සඳහා පූර්ණ අයිතිය ලබා දීමේ වැඩසටහන**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2024 අයවැය යෝජනාවක් අනුව නාගරික නිවාස වැඩසටහන් මඟින් අඩු ආදායම්ලාභී පවුල් වෙත කුලී පදනම මත ලබා දී ඇති මහල් නිවාස වෙනුවෙන් කුලී අය කිරීම අත්හිටුවා එම මහල් නිවාස ඒකකවල අයිතිය නෛතිකව එම ප්‍රතිලාභී පවුල් වෙතම ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුව ඇත. විවිධ නිවාස ව්‍යාපෘති යටතේ නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික ජනවාස සංවර්ධන අධිකාරිය විසින් අඩු ආදායම්ලාභීන් වෙත බද්ද සින්න, වාරික සින්න, සින්නක්කර සහ කුලී යන පදනම් යටතේ නිවාස ලබා දී තිබේ. ඒ අනුව, මාසිකව රුපියල් 3,000/-ක් හෝ ඊට අඩු අගයක කුලී පදනම මත අඩු ආදායම්ලාභීන් වෙත ලබා දී ඇති සියලු නාගරික නිවාස ඒකකවලින් කුලිය අය කර ගැනීම නතර කිරීමටත්, එකී නිවාසවල සින්නක්කර අයිතිය එම අඩු ආදායම්ලාභීන්ට පැවරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමටත් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**10. විදේශ විනිමය සීමා කිරීම් අදියර වශයෙන් ඉවත් කිරීමේ සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා දැනට ක්‍රියාත්මක විදේශ විනිමය නියෝග සඳහා යෝජිත සංශෝධන**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තාව අනුව මෙරට ගෙවුම් ශේෂය ස්ථාවර තත්ත්වයකට ළඟා වීමේදී අදියර වශයෙන් පරිපාලන පියවර ඉවත් කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටී. ඊට අනුගතව, ඇතැම් ජංගම විදේශීය ගනුදෙනු සඳහා ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කිරීම තහනම් කිරීමට අදාළ විදේශ විනිමය සීමා කිරීම් ලිහිල්

කිරීමේ අදියරගත සැලසුම යටතේ වන පියවරයන් ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ නිර්දේශය ලබා දී ඇත. ඒ අනුව, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7(1) වගන්තියෙහි විධිවිධාන අනුව සාදනු ලැබ ඇති නියෝග ප්‍රකාශයට පත් කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය පිණිස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 11. ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ගාමිණී වලේබොඩ මහතා විසින් පෞද්ගලික මන්ත්‍රී යෝජනාවක් වශයෙන් ශ්‍රී ලංකා සැලසුම් තාක්ෂණඥයින්ගේ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. එකී පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 52(6)හි විධිවිධාන පරිදි වාර්තාවක් ලබා ගැනීම පිණිස අධ්‍යාපන ඇමතිතුමා වෙත යොමු කර තිබේ. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති එම පනත් කෙටුම්පත සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී ඇත. එකී පනත් කෙටුම්පත නිර්දේශ කරමින් පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම පිණිස අධ්‍යාපන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 12. 2024 වර්ෂය තුළ මැතිවරණ පැවැත්වීම

රජයේ පවත්නා සීමිත මූල්‍ය අවකාශය තුළ, 2024 වර්ෂය සඳහා වන අයවැය ඇස්තමේන්තු මඟින් රුපියල් බිලියන 10ක් මැතිවරණ පැවැත්වීම වෙනුවෙන් වෙන් කර ඇති බවත්, ජනාධිපතිවරණයට සහ මහ මැතිවරණයට අදාළ වියදම් එකී ප්‍රතිපාදන තුළ කළමනාකරණය කර ගැනීමට සිදු වන බවත් අමාත්‍ය මණ්ඩලය විසින් සැලකිල්ලට ගන්නා ලදී.

එමෙන්ම, පළාත් සභා මැතිවරණය සහ පළාත් පාලන මැතිවරණය පැවැත්වීම සඳහා අවශ්‍ය අරමුදල් රජයේ පවත්නා සීමිත මූල්‍ය අවකාශය තුළ, 2025 වසර සඳහා වන අයවැය මඟින් ලබා දීමට සිදු වන බව ද අමාත්‍ය මණ්ඩලය විසින් නිරීක්ෂණය කරන ලදී. කෙසේ වුවද, 2025

වර්ෂයේදී එකී මැතිවරණ දෙක පැවැත්වීමට ප්‍රථම, 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනත (393 අධිකාරය) ප්‍රකාරව ස්ථාපිත කරන ලද සහ අංක 2354/06 දරන 2023-10-16 දිනැති අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කිරීමට නියමිත නිර්දේශ මත පදනම්ව අවශ්‍ය වන්නේ නම්, අදාළ මැතිවරණ නීති සඳහා වන සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය මත හඳුන්වා දිය යුතු බව ද අමාත්‍ය මණ්ඩලය විසින් වැඩිදුරටත් සැලකිල්ලට ගන්නා ලදී.

ගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද එම කරුණු මත පදනම්ව අවශ්‍ය පියවර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් සිය එකඟතාව ලබා දීමට තීරණය කරන ලදී.

***********